# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත

---

**[සහතිකය සටහන් කළේ 2005 මැයි මස 13 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2005 මැයි මස 13 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිළ : රු. 16.25 යි. තැපැල් ගාස්තුව : රු. 7.50 යි

# 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත

[සහතිකය සටහන් කළේ 2005 මැයි මස 13 වන දින]

එල්. ඩී.— ඕ. 56/90

**ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව හා ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවීම ; කාර්මික උපදේශක කමිටුවක් පත්කිරීම ; ව්‍යසන කළමනාකරණ සැලසුම් පිළියෙල කිරීම ; ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත්කිරීම ; වන්දි ප්‍රදානය පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

පූර්විකාව.

ශ්‍රී ලංකාවේ දේශභූමිය ඇතුළත සිදුවන්නා වූ ඇතැම් ව්‍යසන නිසා ශ්‍රී ලංකාවේ මනුෂ්‍ය ජීවිතය, දේපළ හා පරිසරය තර්ජනයට හා අනතුරට ලක් වී ඇති හෙයින් ද :

ශ්‍රී ලංකාවේ මනුෂ්‍ය ජීවිතය, මහජන දේපළ හා පරිසරය, මේ යට කී ව්‍යසනවල ප්‍රතිවිපාකවලින් ආරක්ෂා කර ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් හා සැලැස්මක් පිළියෙල කිරීම හා ඒ ප්‍රතිපත්තිය හා සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යගත සම්බන්ධීකරණ කමිටු පත්කිරීම මගින් ජාතික දර්ශනයකින් යුතුව ඒ පිළිබඳව ඵලදායී ලෙස කටයුතු කිරීම අවශ්‍ය හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව පිහිටුවීම.

2. (1) (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) එකී සභාව, (1) වන උපවගන්තිය මගින් ඊට පවරනු ලැබ ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් එයට තිබිය යුතු ය. තව ද, ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම සහ එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි වන්නේ ය.

2-P L. 000091- 4,500 (2005/02)

සභාවේ සංයුතිය.

**3**. (1) සභාව,—

(අ) (මෙහි මින්මතු "සභාපති" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාවේ සභාපති විය යුතු, ජනාධිපතිවරයාගෙන් ;

(ආ) සභාවේ උපසභාපතිවරයා විය යුතු, අග්‍රාමාත්‍යවරයාගෙන් ;

(ඇ) විපක්ෂ නායකවරයාගෙන් ;

(ඈ) පහත සඳහන් විෂයයන් භාර අමාත්‍යවරුන්ගෙන් —

(i) සමාජ සුභසාධන ;

(ii) පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණය ;

(iii) පරිසරය ;

(iv) ස්වදේශ කටයුතු ;

(v) සෞඛ්‍ය ;

(vi) විද්‍යා හා තාක්ෂණ ;

(vii) නිවාස ;

(viii) වෙරළ සංරක්ෂණ ;

(ix) වාරිමාර්ග ;

(x) විදුලිබලය ;

(xi) ආරක්ෂක කටයුතු ;

(xii) පොලිසිය ;

(xiii) මුදල් ;

(xiv) ඉඩම් ;

(xv) ධීවර සහ ජලජ සම්පත් ;

(xvi) විදේශ කටයුතු ;

(xvii) ජල සම්පාදන ;

(xviii) මහාමාර්ග ;

(xix) නාගරික සංවර්ධන ;

(xx) අධ්‍යාපනය ;

(ඉ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154අ ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද සෑම පළාත් සභාවකම ප්‍රධාන අමාත්‍යවරුන්ගෙන් :

එසේ වුව ද, යම් පළාතක් සඳහා පළාත් සභාවක් තෝරා පත් කර ගනු නොලැබූ අවස්ථාවක දී, එම පළාත සඳහා පත් කරන ලද ආණ්ඩුකාරවරයාගෙන් ; සහ

(ඊ) (3) වන උපවගන්තියේ සඳහන් තැනැත්තන්ගෙන් ;

සමන්විත විය යුතු ය.

(2) සභාව විසින් සභාවේ ලේකම්වරයා වශයෙන් යම් තැනැත්තකු පත්කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලබන තැනැත්තා සභාවේ සමාජිකයකු ද විය යුතු ය.

(3) විපක්ෂ නායකවරයා විමසා කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවේ විපක්ෂ මන්ත්‍රීවරුන් අතරින් තෝරා ගනු ලබන තැනැත්තන් පස් දෙනෙක් සභාවේ සාමාජිකයන් වශයෙන් නම් කළ යුතු ය.

(4) අවශ්‍ය යයි සභාව සලකන යම් කාල පරිච්ඡේදයක් සඳහා සභාවේ සාමාජිකයකු වශයෙන් වෙන යම් විෂයයක් භාර යම් අමාත්‍යවරයකු සභාව විසින් කලින් කල එක්කර ගනු ලැබිය හැකි ය.

(5) (1) වන උපවගන්තියේ සඳහන් යම් විෂයයක් ජනාධිපතිවරයා විසින් තමන් වෙත පවරා ගනු ලැබූ හෝ අග්‍රාමාත්‍යවරයා වෙත පවරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ජනාධිපතිවරයා විසින් හෝ

අග්‍රාමාත්‍යවරයා විසින් හෝ නම් කරනු ලබන තැනැත්තකු සභාවේ දී ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා වෙත පවරනු ලැබූ අවස්ථාවක, ජනාධිපතිවරයා හෝ අග්‍රාමාත්‍යවරයා හෝ නියෝජනය කරනු ලැබිය යුතු ය.

සභාවේ කර්තව්‍ය.

4. සභාවේ කර්තව්‍ය විය යුත්තේ—

(අ) (i) ව්‍යසනයන්ගෙන් ජනතාවගේ ජීවිතය සහ පරිසරය ආරක්ෂා කිරීම සඳහා සහ ව්‍යසනයෙන් හානියට පත් ප්‍රදේශ පවත්වාගෙන යාම සහ සංවර්ධනය කිරීම සඳහාත් ;

(ii) සූදානම්ව සිටීම, වැළැක්වීමේ ප්‍රතිචාර, සහන සැලසීම පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා සම්පත් ඵලදායී ලෙස භාවිත කිරීම සඳහාත් ;

(iii) ව්‍යසනවලින් මහජනයා ආරක්ෂා කිරීම සඳහා ඔවුන්ට උපකාරිවීමට මහජනතාව තුළ අවබෝධය සහ පුහුණුව වැඩි කිරීම සඳහාත් ;

(iv) ව්‍යසනයට භාජනය විය හැකි ප්‍රදේශවල ජීවත්වන තැනැත්තන් අතර, අවදානම් කළමනාකරණය සඳහා ඇති හැකියාව වර්ධනය කිරීම සහ ව්‍යසන කළමනාකරණය සහ ලිහිල් කිරීමේ පරිචය අදාළ කර ගැනීම සඳහාත්; සහ

(v) ව්‍යසනයෙන් පසු සහන ලබාදීමේ සහ පුනරුත්ථාපන හැකියාවන් පවත්වා ගනිමින් සහ තවදුරටත් වර්ධනය කරමින් පෙර ව්‍යසන සැලසුම්, සූදානම්ව සිටීම සහ ලිහිල් කිරීම සඳහාත්,

විධිවිධාන සලස්වන ව්‍යසන කළමනාකරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සහ වැඩ පිළිවෙලක් සකස් කිරීම.

(ආ) (i) ව්‍යසන සහ වෙනත් යම් හදිසි අවස්ථා සඳහා සූදානම්වීම ;

(ii) අනතුරු වැළැක්වීම ; සහ

(iii) ව්‍යසන වැළැක්වීම සහ ලිහිල් කිරීම,

සඳහා වගබලා ගැනීම පිණිස (අ) ඡේදය යටතේ සකස් කරන ලද ජාතික ප්‍රතිපත්තිය සහ වැඩ

සටහන මත පදනම් වූ ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්මක් සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මක් සූදානම් කිරීම සහ සකස් කිරීම ;

(ඈ) ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සමීක්ෂණය කිරීම සහ එම සැලසුම් අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ;

(ඈ) යම් ව්‍යසනයක් ඇති වූ විට, හදිසි ප්‍රතිචාර, යථාතත්වී කරණය, සහන, පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණ කටයුතු පහසු කරලීම ;

(ඉ) යම් ව්‍යසනයක් හෝ ආසන්නතම ව්‍යසනයක් හෝ මැඩ පැවැත්වීම සඳහා ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්මට අනුකූලව හෝ ඒ කාර්ය සඳහා සභාව විසින් තීරණය කරනු ලබන යම් පියවරවලට අනුකූලව හෝ කටයුතු කිරීම උචිත යයි සලකන අවස්ථාවක, ඒ සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම ;

(ඊ) මේ පනතේ 8 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයේ සහ 21 වන වගන්තිය යටතේ නම් කරන ලද උචිත සංවිධානවල කටයුතු මෙහෙයවීම, සම්බන්ධීකරණය කිරීම හා සමීක්ෂණය කිරීම සහ ඒ මධ්‍යස්ථානය සහ සංවිධාන විසින් ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී තිබෙන සම්පත් ඵලදායී ලෙස යොදා ගන්නා බවට වගබලා ගැනීම ;

(උ) ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්මට සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මට ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබා දීමට වග බලා ගැනීම ;

(ඌ) 10 වන වගන්තිය යටතේ ව්‍යසන කළමනාකරණ සැලසුම් සූදානම් කිරීමේ දී සෑම අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක් සහ රාජ්‍ය සංස්ථාවක් විසින් පිළිපැදිය යුතු උපදෙස් මාලා නිශ්චිතව දැක්වීම ;

(එ) ව්‍යසනයක් ඇති විය හැකි විටෙක සහ සැබැවින්ම ඇති වූ විටෙක දේශීය හා ප්‍රජා මට්ටමින් ස්වශක්තිය පහසුකරලීම සහ ඊට සහාය දීම ;

(ඒ) ව්‍යසන කළමනාකරණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම හා ව්‍යසන කළමනාකරණය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධනයට අරමුදල් සැපයීම ;

(ඔ) උපද්‍රව හා උපද්‍රවයන්ට භාජනය වීමේ ප්‍රවණතාව සෙවීමෙහි සහ අවදානම අඩු කිරීමේ අධ්‍යයනවල යෙදී සිටින්නා වූ හා ක්‍රියාකාරී වැඩසටහන් ක්‍රියාවට නැංවීමේ ලා දායක වන සංවිධාන හා පුද්ගලයන් සමග සබඳතා ඇති කර ගැනීම පහසුකරලීම හා එකී අධ්‍යයන හා ක්‍රියාකාරී වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;

(ඕ) 8 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයට උචිත කර්තව්‍ය සහ වගකීම් පැවරීම ;

(ක) ව්‍යසන වැළැක්වීමට හා ලිහිල් කිරීමට අදාළ වැඩසටහන් ආරම්භ කිරීම සහ සහන, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ කටයුතු සැලසීම ;

(ග) ඇතිවිය හැකි සහ සැබවින්ම ඇති වූ ව්‍යසන හා සම්බන්ධ අදාළ සියලු කරුණු පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම ;

(ච) අදාළ බලධාරින්ගෙන් හා මණ්ඩලවලින් සහ 1993 අංක 58 දරන ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන අරමුදල පනත මගින් පිහිටුවන ලද ප්‍රතිසංස්කරණය සඳහා අරමුදල් වෙන් කිරීම නිර්දේශ කිරීමත් ය.

සභාවේ රැස්වීම්.

**5**. (1) අවශ්‍යයැයි හැඟෙන සියලුම අවස්ථාවන් හි දී සභාවට රැස්විය හැකි අතර, මාස තුනකට එක් වරකට නොඅඩු වන පරිදි එසේ රැස්විය යුතු ය.

(2) සභාපති පැමිණ ඇත්නම් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන සභාපති විසින් දැරිය යුතු ය. සභාවේ එවැනි යම් රැස්වීමකට සභාපති නොපැමිණි විටෙක, උපසභාපතිවරයා ඒ රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

රැස්වීම්වල ගණපූරණය.

**6**. (1) සභාවේ යම් රැස්වීමක ගණපූරණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(2) සභාවේ රැස්වීම් හා ඒ රැස්වීම්වල කටයුතු කිරීම පිළිබඳ කාර්ය පරිපාටිය සභාව විසින් විධිමත් කරනු ලැබිය හැකි ය.

සභාවේ මුද්‍රාව.

7. (1) සභාවේ මුද්‍රාව සභාව විසින් නිශ්චය කර, පිළියෙල කරනු ලැබිය යුතු අතර, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් වෙනස් කරගනු ලැබිය හැකි ය.

(2) සභාවේ මුද්‍රාව, සභාවේ ලේකම් භාරයේ තිබිය යුතු ය.

(3) සභාවේ මුද්‍රාව සභාවේ අනුමතය ඇතිව සහ සභාවේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන් තබනු ලැබිය යුතු ය.

(4) සභාවේ මුද්‍රාව තැබූ සාධන පත්‍ර හා ලේඛන පිළිබඳ රෙජිස්ටරයක් සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවීම.

8. (1) මේ පනතේ කාර්ය සඳහා, අධ්‍යක්ෂ ජනරාල්වරයකුගේ ප්‍රධානත්වයෙන් යුත් සහ සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවකින් සමන්විත වන ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයක් පිහිටුවනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ වෙනත් අධ්‍යක්ෂවරුන් අමාත්‍යවරයා විමසා සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන මධ්‍යස්ථානයේ කර්තව්‍ය සභාව විසින් පවරනු ලබන පරිදි විය යුතු අතර, එම කර්තව්‍යවලට පහත සඳහන් කර්තව්‍ය ඇතුළත් විය යුතු ය :—

(අ) ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම පිළියෙල කිරීමෙහි ලා සභාවට සහය වීම සහ අවශ්‍ය වූ විටෙක එය උසස් තත්ත්වයට පත් කිරීම පිණිස යෝජනා ඉදිරිපත් කිරීම සඳහා සභාවට සහාය වීම ;

(ආ) ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් භාරගැනීම සහ ව්‍යසන අවස්ථාවක් ප්‍රකාශයට පත් කිරීමේ දී ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම ;

(ඈ) අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථා විසින් පිළියෙල කරනු ලබන විවිධ ව්‍යසන කළමනාකරණ සැලැස්මවල් ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්මට අනුකූල වන බවට වගබලා ගැනීම ;

(ඇ) 10 වන වගන්තිය යටතේ විවිධ අමාත්‍යාංශ, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා විසින් පිළියෙල කරන ලද ව්‍යසන කළමනාකරණ සැලැස්මවල් මත පදනම්ව ව්‍යසනවලට සූදානම් වීම, ව්‍යසන අඩුකිරීම, වැළැක්වීම, සහන සැලසීම, පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රතිසංස්කරණ කටයුතු කිරීම යන කරුණු සඳහා වැඩසටහන් සහ සැලසුම් පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීම හා එවැනි වැඩසටහන් සහ සැලසුම් ක්‍රියාත්මක කරන සංවිධාන සමග සම්බන්ධීකරණය කිරීම සහ එවැනි කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයෙන් මූල්‍ය සහාය ලබාගැනීම සහ එම මුදල් අදාළ ප්‍රදේශවලට මුදාහැරීම සහ එම කටයුතු නියාමනය කිරීම සහ ඇගැයීම ;

(ඉ) ව්‍යසන කළමනාකරණයට අදාළ කටයුතු පිළිබඳව උචිත සංවිධානවලට, රාජ්‍ය නොවන සංවිධානවලට, දිසා ලේකම් කාර්යාලවලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට, උපදෙස් සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ එවැනි සංවිධාන සහ ලේකම් කාර්යාල සමග සම්බන්ධීකරණය වෙමින් වැඩසටහන් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ඊ) ව්‍යසන කළමනාකරණයට අදාළව පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ව්‍යසන කළමනාකරණය පිළිබඳ දත්ත සමුදායක් පිහිටුවා පවත්වාගෙන යාම ; සහ

(උ) මධ්‍යස්ථානයේ කටයුතු පිළිබඳ වාර්තා වරින්වර සහ සභාවට අවශ්‍ය වන අවස්ථාවල දී සභාව වෙත ඉදිරිපත් කිරීම.

තාක්ෂණ උපදේශක කමිටු පත්කිරීම.

**9**. (1) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ දී, සභාවේ අවස්ථාවෝචිත පරිදි සභාවේ අදාළ කර්තව්‍ය සහ වගකීම්වලට අදාළ විශේෂඥ දැනුමක් ඇති වෘත්තිකයන්ගෙන් සහ විශේෂඥයන්ගෙන් සමන්විත වන සහ සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන තාක්ෂණික උපදේශක කමිටු සංඛ්‍යාවක් විසින් සභාවට සහ ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයට සහාය විය යුතු ය.

(2) තාක්ෂණික උපදේශක කමිටුවල සාමාජිකයන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සංස්ථාපනය කරනු ලබන තාක්ෂණික උපදේශක කමිටුවල සභාපතිවරුන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය

**10.** (1) යම් අමාත්‍යාංශයක්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථාව සම්බන්ධයෙන් යම් ව්‍යසනයක් හෝ ආසන්නතම ව්‍යසනයක් මැඩපැවැත්වීම සඳහා, ව්‍යසන කළමනාකරණ සැලැස්ම මත පදනම් වූ සහ සභාව විසින් නියම කරනු ලැබිය හැකි යම් මාර්ගෝපදේශවලට අනුකූල වූ ව්‍යසන කළමනාකරණ සැලැස්මක් පිළියෙල කිරීම, සෑම අමාත්‍යාංශයකම, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකම සහ රාජ්‍ය සංස්ථාවකම කාර්යය වන්නේ ය.

*ව්‍යසන කළමනාකරණ සැලැස්ම.*

(2) (1) වන උපවගන්තියේ සඳහන් අමාත්‍යාංශයක්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත් ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සිය ව්‍යසන කළමනාකරණ සැලැස්ම සකස් කිරීමෙහි ලා අවශ්‍ය සියලු සහාය එම අමාත්‍යාංශයට, දෙපාර්තමේන්තුවට හෝ සංස්ථාවට ලබා දිය යුතු ය.

(3) සෑම අමාත්‍යාංශයක්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් ම, යම් ව්‍යසනයක් හෝ ආසන්නතම ව්‍යසනයක් මැඩපැවැත්වීම සඳහා, අවස්ථාවෝචිත පරිදි ඒ අමාත්‍යාංශය,ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව හෝ රාජ්‍ය සංස්ථාව විසින් ගැනීමට යෝජිත ව්‍යසන ප්‍රතිපියවර වලට අදාළ විස්තරාත්මක ව්‍යසන කළමනාකරණ සැලැස්මක්, සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් සඳහන් කරනු ලබන යම් දිනයක හෝ ඊට පෙර මධ්‍යස්ථානය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ මධ්‍යස්ථානය වෙත ලැබුන සෑම ව්‍යසන කළමනාකරණ සැලැස්මක්ම මධ්‍යස්ථානය විසින් අනුමතය සඳහා සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**11.** (1) යම් අවස්ථාවක, ව්‍යසනයක හෝ ආසන්නතම ව්‍යසනයක ප්‍රමාණය හෝ බරපතලකම කොතෙක් විශාල වේ ද, නැතහොත්, විශාල විය හැකි ද යත්, ඒ ව්‍යසනය හෝ ආසන්නතම ව්‍යසනය මැඩපැවැත්වීම සඳහා අවශ්‍ය විය හැකි ප්‍රතිපියවර කිසිවක් සාමාන්‍යයෙන් පරිපාලනයට ලබාගත හැකි සම්පත් හෝ වත්කම් ඉක්මවා යතොත්, ජනාධිපතිවරයා විසින්, ජනාධිපතිවරයාගේ මෙහෙයවීමෙන් ම හෝ සභාවේ උපදෙස් මත කරනු ලබන ප්‍රකාශනයක් මගින්, ඒ ප්‍රකාශනයේ සඳහන් යම් ප්‍රදේශයක් හෝ ප්‍රදේශ සම්බන්ධයෙන්, නැතහොත්, මුළු රටේම ව්‍යසන තත්ත්වයක් පවතින බව ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

*ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීම.*

(2) (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, (1) වන උපවගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයක්, ඒ ප්‍රකාශනය කරන ලද දින පටන් බලාත්මක විය යුතු අතර, එම ප්‍රකාශනයේ දින සිට මාස දෙකක කාලයක් සඳහා බලාත්මක විය යුතු ය. ඉන්පසු අවශ්‍ය වුවහොත් එක් වරකට මාස දෙකකට නොවැඩි තවදුරටත් වූ කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද ප්‍රකාශනයක්, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් අනුමත කිරීම සඳහා ප්‍රකාශනය ප්‍රකාශයට පත් කළ දිනයට ඉක්බිතිවම පැවැත්වෙන ප්‍රථම රැස්වීමට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබූ යම් ප්‍රකාශනයක් පාර්ලිමේන්තුව විසින් අනුමත නොකරන්නේ නම්, ඒ ප්‍රකාශනය ඒ යටතේ නීත්‍යානුකූලව කරන ලද කිසිවකට හානියක් නොමැතිව, ඒ අනනුමතයට ඉක්බිතිවම වලංගු වීම සහ නීතියෙහි ලා බලාත්මක වීම නතර වන්නේ ය.

ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත්කරනු ලැබූ විට අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය.

**12.** (1) ජනාධිපතිවරයා විසින් ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කරනු ලැබූ විට, පහත දැක්වෙන ක්‍රියා මාර්ග වහාම ගත යුතු යයි 21 වන වගන්තිය යටතේ සභාව විසින් නම් කරන ලද උචිත සංවිධාන එකකට හෝ වැඩි ගණනකට ජනාධිපතිවරයා විසින් විධාන කරනු ලැබිය යුතු ය:—

(අ) ව්‍යසනයේ හෝ ආසන්නතම ව්‍යසනයේ බලපෑම මැඩපැවැත්වීම සඳහා හෝ ඒ ව්‍යසනයේ හෝ ආසන්නතම ව්‍යසනයේ බලපෑම ලිහිල් කිරීම සඳහා, 11 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශනයක් කරන ලද්දේ යම් ප්‍රදේශයක් හෝ ප්‍රදේශ සම්බන්ධයෙන් ද, ඒ ප්‍රදේශය හෝ ප්‍රදේශ ඇතුළත පවත්නා අවශ්‍ය විය හැකි සියලුම සම්පත් මෙහෙයවීම, සම්බන්ධීකරණය කිරීම හා භාවිතා කිරීම ;

(ආ) අතිරේක සම්පත් ඇත්නම්, ඒ අතිරේක සම්පත් ලබාගත හැකි විටෙක, ඒ සම්පත් වෙන් කර දීම සම්බන්ධයෙන් ඇතිකර ගනු ලබන යම් වැඩපිළිවෙලට අනුකූලව ඒ අතිරේක සම්පත් මෙහෙයවීම, සම්බන්ධීකරණය කිරීම සහ භාවිතා කිරීම ; සහ

(ඈ) ජනාධිපතිවරයා විසින් යම් උචිත සංවිධානයක් වෙත නිකුත් කරනු ලැබිය හැකි යම් විධානවලට අනුකූලව, අවස්ථාවෝචිත පරිදි, ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්මේ හෝ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්මේ විධිවිධාන සලස්වා ඇති පරිදි යම් අවශ්‍ය පියවර ගැනීම.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, 11 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කරනු ලැබූ විට, සෑම අමාත්‍යාංශයක්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් ම, අවස්ථාවෝචිත පරිදි, 10 වන වගන්තිය යටතේ පිළියෙල කරන ලද ස්වකීය ව්‍යසන කළමනාකරණ සැලැස්ම ඒ ඒ අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව හෝ සංස්ථාව ඇතුළත වහාම ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය.

සභාව විසින් රාජ්‍ය නොවන සංවිධානවල සහාය ලබා ගත යුතු බව.

**13.** (1) 12 වන වගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 11 වන වගන්තිය යටතේ ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කරනු ලැබූ අවස්ථාවක සභාව විසින්, අවශ්‍ය හෝ උචිත යයි සභාව සලකන කවර විටෙක දී වුව ද, 12 වන වගන්තිය යටතේ යම් උචිත සංවිධානයක් විසින් ඉටුකරන කාර්ය කරගෙන යාමේ දී ඊට සහායවීම සඳහා ස්වකීය ක්‍රියාකාරකම් ජාතික ස්වාධීනත්වයට සහ ස්වෛරීභාවයට හානිකර නොවන රාජ්‍ය නොවන සංවිධානයක් වන යම් රාජ්‍ය නොවන සංවිධානයක සහාය ලබාගත හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රාජ්‍ය නොවන සංවිධානයක සහාය ලබාගත් අවස්ථාවක දී, එකී රාජ්‍ය නොවන සංවිධානය, එය සහාය දෙන උචිත සංවිධානය විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව ක්‍රියා කරනු ලැබිය යුතු අතර, කරන ලද සේවය සඳහා සභාව විසින් නිශ්චය කරනු ලබන යම් මුදලක් සභාව විසින් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

උචිත සංවිධානයක කාර්ය.

**14.** (1) 12 වන වගන්තිය යටතේ ක්‍රියා කිරීමට විධාන කරනු ලැබූ යම් උචිත සංවිධානයක් විසින් –

(අ) ඒ නම් කරන ලද සංවිධානය සාධාරණ හේතු මත විශ්වාස කරන ආකාරයෙන් මිනිස් ජීවිත බේරාගැනීමේ කාර්යය සඳහා හෝ මිනිස් ජීවිතවලට හානි සිදුවීම වැළැක්වීම සඳහා හෝ ජීවිත අනතුරට පත් තැනැත්තන් මුදවා ගැනීම සඳහා හෝ පීඩාවට පත් තැනැත්තන් පීඩා විඳීමෙන් හා ව්‍යසනයෙන් මුදවා ගැනීම සම්බන්ධයෙන් හෝ වෙනත් යම් හදිසි පියවර ගැනීම පහසු කරලීම සඳහා යම් ස්ථානයකට ඇතුල්වීම අවශ්‍ය වන්නා වූ අවස්ථාවක, ඒ ස්ථානයට ඇතුල්වීමේ ;

(ආ) පීඩාවට පත් වූ හෝ පීඩාවට පත්වීමට ඉඩ ඇති ප්‍රදේශවලින් මිනිසුන්,දේපළ හා සතුන් ඉවත් කිරීමේ ;

(ඇ) පොලිසිය හා සන්නද්ධ හමුදා පැමිණෙන තුරු ව්‍යසන ප්‍රතිපියවර ක්‍රියාත්මක කිරීම සඳහා යම් පාරක් හෝ වීථියක් (ප්‍රසිද්ධ හෝ පෞද්ගලික), මාර්ග අයිතියක් හෝ යම් ප්‍රසිද්ධ ස්ථානයක් ගමනාගමනය සඳහා වසා දැමීමේ ;

(ඈ) ව්‍යසන ප්‍රතිපියවර ක්‍රියාත්මක කිරීමේ දී බාධා පැමිණ විය හැකි යම් අවහිරයක් පොලිසියේ හෝ සන්නද්ධ හමුදාවල සහාය ඇතිව ඉවත්කිරීමේ ; සහ

(ඉ) අවස්ථානුගත පරිදි, යම් උචිත සංවිධානයක් විසින් ව්‍යසන ප්‍රතිපියවර කිසිවක් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, යුක්තිසහගතව අවශ්‍ය යයි සලකන වෙනත් යම් ක්‍රියාවක් කිරීමට හෝ 12 වන වගන්තිය යටතේ ඒ සංවිධානය හෝ සංවිධාන විෂයයෙහි විධාන කරනු ලබන යම් කාර්යයකට මූලික වූ හෝ ආනුෂංගික වූ යම් ක්‍රියාවක් කිරීමේ,

කාර්යය කළ යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, යම් උචිත සංවිධානයක් වෙත (1) වන උපවගන්තිය යටතේ පැවරුනු කාර්යය, 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ස්වකීය කාර්යය ඉටුකිරීමේ දී සභාව විසින් ඒ සංවිධානය වෙත බලය දී ඇති ප්‍රදේශය හෝ ප්‍රදේශ ඇතුළත පමණක් ඒ සංවිධානය විසින් ක්‍රියාවේ යෙදවිය යුතු ය.

වන්දි ප්‍රදානය.

**15**. (1) 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ උචිත සංවිධානයක් විසින් යම් ක්‍රියාවක් සිදු කිරීමේ දී හෝ 14 වන වගන්තිය යටතේ එම සංවිධානය වෙත පැවරුණු කාර්යය ඉටු කිරීමේ දී හෝ 13 වන වගන්තිය යටතේ උචිත සංවිධානයකට සහාය දෙන රාජ්‍ය නොවන යම් සංවිධානයක් විසින් හෝ පොලිස් නිලධරයකු හෝ සන්නද්ධ හමුදාවල සාමාජිකයකු විසින් කරන ලද යම් ක්‍රියාවක්, නොකර හැරීමක් හෝ පැහැර හැරීමක් හේතුකොටගෙන තම දේපළවලට අලාභයක් හෝ පාඩුවක් සිදුවන යම් තැනැත්තකුට, ඒ අලාභය හෝ පාඩුව සම්බන්ධයෙන්, ඒ දේපළ පිහිටියේ යම් ප්‍රදේශයක් ඇතුළත ද, ඒ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලබන වන්දියකට හිමිකම ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු වන්දිය නිශ්චය කිරීමේ කාර්යය සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ආණ්ඩුවේ තක්සේරුකරුවකුගේ සහාය ලබාගත හැකි ය.

(3) දේපළකට සිදු වූ යම් පාඩුවක් හෝ අලාභයක් සඳහා ගෙවන ලද වන්දිය සම්බන්ධයෙන් ආරවුලක් ඇති වූ විටක, ඒ දේපළ පිහිටියේ යම් දිසා අධිකරණයක අධිකරණ බලසීමාව ඇතුළත ද, ඒ දිසා අධිකරණය විසින්, ඒ පාඩුව හෝ අලාභය සිදු වූ තැනැත්තා විසින් ඒ සඳහා කරන ලද ඉල්ලීමක් මත ලඝු කාර්ය පරිපාටිය අනුව තීරණය කරනු ලැබිය යුතු ය.

**16**. සභාවේ ආරම්භක ප්‍රාග්ධනය රුපියල් මිලියන දහයක් විය යුතු ය. ආරම්භක ප්‍රාග්ධනයේ මුදල, ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, 17 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලට එකී මුදල් ප්‍රමාණය බැර කරනු ලැබිය යුතු ය. සභාවේ ප්‍රාග්ධනය.

**17**. (1) සභාවට, එයටම අයත් වූ අරමුදලක් තිබිය යුතු ය. අරමුදලට පහත දැක්වෙන මුදල් බැරකළ යුතු ය :— සභාවේ අරමුදල.

(අ) සභාවේ ආරම්භක ප්‍රාග්ධනය වශයෙන් ඒකාබද්ධ අරමුදලින් ලැබූ මුදල ;

(ආ) ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ දී සභාව විසින් ලබාගත හැකි යම්තාක් වූ සියලු මුදල් ප්‍රමාණ ; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් බැහැරව කවර වූ හෝ නීත්‍යානුකූල ප්‍රභවයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් සභාව විසින් ලබාගත හැකි යම්තාක් වූ සියලු මුදල් ප්‍රමාණ.

(2) මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ දී සභාව විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය විය හැකි යම්තාක් වූ මුදල් ප්‍රමාණ සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**18**. (1) සභාවේ මුදල් වර්ෂය, ලිත් වර්ෂය විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) සභාවේ ආදායම සහ වියදම සම්බන්ධයෙන් ද, වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් සහ වෙනත් සියලු ගණුදෙනු සම්බන්ධයෙන් යථා පරිදි ගිණුම් පොත් තබා ගැනීමට සභාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන සභාවේ ගිණුම් විගණනය කිරීමට හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටස අදාළ වීම.

**19**. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, සභාවේ මුදල් පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සභාවේ කාර්ය මණ්ඩලය.

**20**. (1) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සඳහා සහ මේ පනත පරිපාලනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යයි සභාව සලකන නිලධරයන්, සේවකයන් හා අනුයෝජිතයන් යම් සංඛ්‍යාවක් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) පළමුවන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට, සේවකයන්ට හා අනුයෝජිතයන්ට සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් සහ යම් අනුප්‍රමාණවලට අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, ඔවුන් එසේ නිශ්චය කරනු ලැබිය හැකි සේවා කොන්දේසිවලට ද යටත් විය යුතු ය.

(3) සභාවේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ හා රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව සහ, එවැනිම කැමැත්ත ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාල පරිච්ඡේදයක් සඳහා, සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත්, එවැනිම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(4) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාල සීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වූ යම් තැනැත්තකු සභාව විසින් සේවයේ නියුක්ත කරනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් සභාවට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

**21**. (1) උචිත යයි සභාව සලකන කවර හෝ විටක සභාව විසින්, අවස්ථාවෝචිත පරිදි, ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම හෝ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම කරගෙන යාම හා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ සහ සභාවට මේ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමෙහිලා සාමාන්‍යයෙන් සහාය වන්නා වූ (මේ පනතේ " උචිත සංවිධානයක් " වශයෙන් සඳහන් කරනු ලබන) උචිත සංවිධානයක් වශයෙන් යම් අමාත්‍යාංශයක්, ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, රාජ්‍ය සංස්ථාවක් හෝ ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය නම් කරනු ලැබිය හැකි ය.

උචිත සංවිධාන නම් කිරීම.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ එම උචිත සංවිධානයෙන් ඉල්ලා සිටිය හැකි යම් කාර්ය ඉටු කරන ලෙස ද, උචිත සංවිධානයට නියම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් ඒ ඒ සැලසුම් කරගෙන යාම හා ක්‍රියාත්මක කිරීම සඳහා උචිත සංවිධානයක් විසින් ඉටු කළ යුතු කර්තව්‍ය නිශ්චය කිරීම, නියම කිරීම සහ අවශ්‍ය විටෙක ඒ සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම ද, සභාව විසින් කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සභාව විසින් උචිත සංවිධානයක් නම් කරනු ලැබූ අවස්ථාවක, සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයක් මගින්, ඒ එක් එක් උචිත සංවිධානය විසින් එකී සංවිධානයේ ක්‍රියාත්මක කිරීමේ කටයුතු කරගෙන යා යුතු ප්‍රදේශය හෝ ප්‍රදේශ නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය.

(5) උචිත සංවිධානයක් විසින්, මේ පනත යටතේ වූ ස්වකීය බලතල, ඒ සංවිධානය විසින් ඒ සඳහා ලියවිල්ලකින් විශේෂයෙන් පත් කරන ලද නිලධරයන් මගින් පමණක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

**22**. (1) ලියවිල්ලකින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසි වලට යටත්ව සභාපති විසින්, මේ පනත යටතේ වූ ස්වකීය බලතල, කාර්ය හෝ කර්තව්‍ය සියල්ලක්ම හෝ කිසිවක්, සභාවේ යම් සාමාජිකයන් වෙත හෝ නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

සභාපති විසින් බලතල, කාර්ය හා කර්තව්‍ය පැවරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ එවැනි යම් පැවරීමක් සිදු කර තිබුනේ වුව ද, එවැනි යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම, සභාපති විසින් කරනු ලැබිය හැකි ය.

(3) (1) උපවගන්තිය යටතේ වූ යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පවරනු ලැබ ඇත්තේ යම් සාමාජිකයකු වෙත ද නැතහොත් නිලධරයකු වෙත ද, ඒ සාමාජිකයා හෝ නිලධරයා විසින්, ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී සභාපති විසින් ඒ සාමාජිකයා හෝ නිලධරයා වෙත කලින් කල ලියවිල්ලකින් දැනුම් දෙන විධාන හෝ කොන්දේසි කිසිවකට අනුකූලව, කටයුතු කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් බලතලයක්, කාර්යයක් හෝ කර්තව්‍යයක් පවරනු ලැබූ සභාවේ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට එසේ පවරනු ලැබූ බලතලයට, කාර්යයට, හෝ කර්තව්‍යයට ආනුෂංගික වන සියලු ක්‍රියා සහ දේ ඉටු කිරීමට බලය තිබිය යුතු ය.

සද්භාවයෙන් කරන ලද ක්‍රියාවන් සම්බන්ධයෙන් ආරක්ෂාව.

**23**. මේ පනත යටතේ පවරන ලද කාර්යයන් කිරීමේ දී සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, සභාවේ සාමාජිකයකුට හෝ 12 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් බලය දෙන ලද උචිත සංවිධානයකට හෝ පොලිස් නිලධරයකුට හෝ සන්නද්ධ හමුදාවල සාමාජිකයකුට හෝ එරෙහිව, කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

වැරදි හා දණ්ඩන.

**24**. මේ පනත මගින් තමා වෙත පවරන ලද යම් බලයක් ක්‍රියාත්මක කරන්නා වූ හෝ නියම කරන ලද යම් කාර්යයක් ඉටු කරන්නා වූ හෝ යම් තැනැත්තකුට පහර දෙන, අවහිර කරන, තර්ජනය කරන, බිය ගන්වන, පරිභව කරන හෝ අපහාස කරන සෑම තැනැත්තකුම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම හා දඩය යන දඬුවම් දෙකටම ඔහු යටත් විය යුතු ය.

අර්ථ නිරූපණය.

**25**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි–

"ව්‍යසනය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකගේ ආරක්ෂාවට හෝ සෞඛ්‍යයට අන්තරායදායක වන්නා වූ හෝ අන්තරායකාරී වන බවට තර්ජනයක් පවතින්නා වූ නැතහොත්, යම් දේපළක් විනාශ කරන්නා වූ හෝ හානියට පමුණුවන්නා වූ හෝ විනාශ වන බවට හෝ හානි සිදුවන

බවට හෝ තර්ජනයක් වන්නා වූ ද, ස්වාභාවික හෝ මිනිසා විසින් සිදු කරනු ලබන්නා වූ ද සිද්ධියක්, සැබැවින්ම සිදුවීම හෝ සිදුවීමට ආසන්න වීම අදහස් වන අතර, ඊට–

(අ) නායයාමක් ;
(ආ) සුළි සුළඟක් ;
(ඇ) ගං වතුරක් ;
(ඈ) නියඟයක් ;
(ඉ) කාර්මික උපද්‍රවයක් ;
(ඊ) සුනාමියක් (භූමිකම්පනාසන්න චලනයක්) ;
(උ) භූමි කම්පාවක් ;
(ඌ) ගුවන් උපද්‍රවයක් ;
(එ) සමුද්‍රීය උපද්‍රවයක් ;
(ඒ) ගින්නක් ;
(ඔ) වසංගතයක් ;
(ඕ) පිපිරීමක් ;
(ක) ගුවන් ප්‍රහාරයක් ;
(ග) සිවිල් හෝ අභ්‍යන්තර ගැටුමක් ;
(ච) රසායනික අනතුරක් ;
(ජ) විකිරණශීලිත්වයෙන් හටගත් හදිසි අවස්ථාවක් ;
(ට) ගොඩබිම සහ මුහුදේ සිදුවන තෙල් පිටාර ගැලීම් ඇතුළුව තෙල් පිටාර ගැලීමක් ;
(ඩ) න්‍යෂ්ටික ආපදාවක් ;
(ණ) නාගරික සහ වනාන්තර ගිනිගැනීමක් ;
(ත) වෙරළ ඛාදනය වීමක් ; සහ
(ද) ටොනාඩෝ චණ්ඩ මාරුතයක්, අකුණු සැර වැදීමක් සහ දරුණු ගිගිරුම් සහිත කුණාටුවක්,

ඇතුළත් වේ ;

“ව්‍යසන සඳහා ප්‍රතිපියවර” යන්නෙන්, සිදුවීමට ආසන්න ව්‍යසනයක ඵලවිපාක වළක්වා ලීම, අවම ප්‍රමාණයට අඩු කිරීම හෝ ඊට ප්‍රතිවිරුද්ධව කටයුතු කිරීම සඳහා හෝ ව්‍යසනයකට පසුව ඇතිවන ඵලවිපාක ජනතාව වෙත හෝ යම් පුද්ගලයකුට අයත්, රජයට අයත් යම් දේපළක් වෙත හෝ බලපෑම අඩු කිරීම සඳහා හෝ අවශ්‍ය වන හෝ යෝග්‍ය වන පියවර අදහස් වන අතර, තත්කාර්ය සඳහා වූ පුහුණු කිරීම් පැවැත්වීම් හෝ ඒවාට සහභාගීවීම ඊට ඇතුළත් වේ ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද්දා වූ හෝ පිහිටුවාගනු ලැබුවා වූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ; සහ

"සම්පත්"යන්නට ජන ජීවිතය සඳහා අත්‍යවශ්‍ය යයි සලකනු ලබන මිනිස් ශ්‍රමය හෝ සතුන්, වාහන, බෝට්ටු, පිරියත, උපකරණ, උවාරණ, පස් ඉවත් කිරීමේ යන්ත්‍රෝපකරණ හෝ කවර වුව ද වර්ගයකට අයත් වෙනත් උපකරණ, මුදල්, ගබඩා පහසුකම්, චංචල හා නිශ්චල දේපළ ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**26**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.